# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2026 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීමට කැමති සැපයුම්කරුවන්ගෙන්, නිෂ්පාදකයන්ගෙන්, අලෙවි නියෝජිතයන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**භාණ්ඩ සැපයීම**

1. ලිපි ද්‍රව්‍ය ( පැන්සල්, මකන, අඩිකෝදු, සී.ආර්. පොත්, මකන දියර, ආදීය)
2. බෝල් පොයින්ට් පෑන් වර්ග
3. ඡායා පිටපත් කඩදාසි
4. යතුරු ලියන කඩදාසි
5. ෆයිල් කවර
6. පරිගණක කඩදාසි
7. ලියුම් කවර
8. දින මුද්‍රා සහ රබර් මුද්‍රා
9. ලේසර් ජෙට් පරිගණක ප්‍රින්ටර් සඳහා ටෝනර් (නියම නිෂ්පාදන පමණි)
10. ඝනක යන්ත්‍ර
11. මේස විදුලි පංකා, සිටුවන විදුලි පංකා, බොක්ස් විදුලි පංකා, සිවිලින් විදුලි පංකා ආදීය
12. විදුලි සහ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ හා උපකරණ
13. විදුලි උපකරණ සවිකිරීම සඳහා (ප්ලග්, ප්ලග් ටොප්, ස්විට්ච්, ටියුබ් බල්බ්, වයර් ආදීය)
14. ඡායා පිටපත් යන්ත්‍ර
15. මුහුණු හා ඇඟිලි ස්කෑන් පැමිණීමේ සටහන් උපාංග / මුද්‍රණ යන්ත්‍රය / ලැමිනේටින් යන්ත්‍රය / පොත් බැඳීමේ යන්ත්‍රය / ෂ්‍රෙඩර්ස් ආදිය
16. Smart Board, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් සහ එහි තිර
17. තැපැල් මුද්‍රා යන්ත්‍ර
18. වායු සමීකරණ යන්ත්‍ර
19. තනි පුද්ගලික පරිගණක, ලැප්ටොප් පරිගණක ආදිය
20. ඩොට් මෙට්‍රික්ස් මුද්‍රණ යන්ත්‍ර
21. ලේසර් ජෙට් මුද්‍රණ යන්ත්‍ර
22. පරිගණක උපාංග ( කී බෝඩ්, මවුසය, මදර්බෝඩ්, රැම්, හාඩ්ඩිස්ක්, මොනිටර්ස් ආදිය)
23. QR කෝඩ් ස්කෑනර් සහ QR කෝඩ් ප්‍රින්ටර
24. පරිගණක ජාලකරණය සහ ඒයට අවශ්‍ය උපාංග
25. ස්කෑනින් යන්ත්‍ර, ඩිජිටල් ස්කෑනින් උපකරණ
26. යූ.පී.එස්, අධිබලැති යූ.පී.එස්
27. කාර්යාලීය උපකරණ මේස, පුටු, පරිගණක මේස ආදිය (ලී / වානේ / මෙලමයින් )
28. කාර්යාලීය උපකරණ ෆයිල් කැබිනට් ලාච්චු 2D, 3D, 4D, කබඩ්, මුදල් පෙට්ටි ආදිය (ලී/වානේ /මෙලමයින්)
29. ගබඩා රාක්ක, ප්‍රදර්ශන රාක්ක, වානේ රාක්ක, තට්ටු ආදිය
30. යකඩ සේප්පු, ආරක්ෂණ ලොකර, ගින්නට ඔරොත්තු දෙන දත්ත සේප්පු
31. ඇලුමිනියම් භාණ්ඩ, උපකරණ හා උපාංග
32. ගොඩනැගිලි ද්‍රව්‍ය උපකරණ (පී.වී.සී බට, ජී.අයි.බට, තීන්ත ඒයට අදාළ භාණ්ඩ ආදිය)
33. මෝටර් රථ සඳහා ටයර් සහ ටියුබ්
34. බැටරි, යූ.පී.එස් බැටරි, මෝටර් රථ සඳහා බැටරි, බැටරි අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා
35. තිර රෙදි සැකසීම සහ සවිකිරීම, වර්ටිකල් බ්ලයින්ඩ්ස් සැපයීම සහ සවිකිරීම
36. වතුර බොයිලේරු, වතුර ෆිල්ටර්, කේතල්, තේ සැපයීම සඳහා භාවිතා කරන බහලුම
37. දුරකථන සහ අමතර කොටස්
38. ගබඩා මෙහෙයුම සඳහා අවශ්‍ය උපකරණ සහ මෙවලම්, තල්ලු කරන ට්‍රොලි, පැලැට් ට්‍රක්, ගබඩා ට්‍රොලි, ගබඩා බඳුන් බාස්කට් ආදිය
39. රක්ෂණාවරණ (ගොඩනැගිලි, රථවාහන, උපකරණ ආදි...)
40. විදුලි ගේට්ටු හා රථගාල් කළමනාකරණ පද්ධති

**මුද්‍රණ කටයුතු**

41. මුද්‍රණය කරන ලද පරිගණක කඩදාසි
42. කාර්යාලීය ලිපිලේඛන, රිසිට්පත් මුද්‍රණය, සඟරා, අත් පත්‍රිකා, පෝස්ටර්,

**සේවාවන් සැපයීම**

43. තනි පුද්ගලික පරිගණක, ප්‍රින්ටර්ස්, කී බෝඩ්, ආදිය අලුත්වැඩියාව සහ නඩත්තුව
44. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව සහ නඩත්තුව
45. ඉලෙක්ට්‍රොනික් සහ විදුලි භාණ්ඩ අලුත්වැඩියාව
46. මේස, පුටු, කබඩ්, කැබිනට්, ආදිය අලුත්වැඩියාව
47. කාර්යාලීය උපකරණ සඳහා තීන්ත ආලේපනය, පොලිෂ් කිරීම, තීන්ත ස්ප්‍රේ කිරීම ආදිය
48. කාර්යාලය ඇතුළත නවීකරණයන්, කාමර කොටස් වෙන් කිරීම, ඇලුමිනියම් සවිකිරීම සහ ඉදිකිරීම් ආදිය
49. සුළු ගොඩනැගිලි නිර්මාණයන් සහ ඉදිකිරීම්
50. සුළු ගොඩනැගිලි අලුත්වැඩියාවන් සඳහා පළපුරුදු පුද්ගලයන් (සිවිල්, විදුලි, ජලනළ තීන්ත ආලේපනය ආදිය)
51. ඇලුමිනියම් කොටස් සවිකිරීම, වානේ කොටස් සවිකිරීම, වෙල්ඩින් කිරීම, වීදුරු කැපීම සහ සවිකිරීම සඳහා පළපුරුදු පුද්ගලයන් උපකරණ මෙවලම් සමග
52. මෝටර් රථ වාහන කුලියට ලබා ගැනීම (කාර්,වෑන්, බස්, ලොරි)

**මෝටර් රථ අළුත්වැඩියා කිරීම සහ සේවා කටයුතු**

53. වාහන අළුත්වැඩියාව (සුළු හෝ ප්‍රධාන)
54. කුෂන් කිරීම
55. වාහන වල වායුසමීකරණයන් අළුත්වැඩියාව
56. වාහන සර්විස් කිරීම

අයදුම්පත් **2025 ඔක්තෝබර් මස 14** වන දින සිට නිකුත් කරනු ලබන අතර, ඒ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් **සේ.නි.භා. අරමුදල් මණ්ඩලයේ, ප්‍රසම්පාදන අංශය, 23 වන මහල, මෙහෙවර පියෙස ගොඩනැගිල්ල, නාරාහේන්පිට, කොළඹ 5 හි උදේ 9.00 සිට ප.ව. 3.30** දක්වා කාර්යාල වේලාවන් තුළ අයදුම්පත් (නොමිලේ) ලබාගත හැක.

නැතහොත් සේ.නි.භා. අරමුදල් මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන **www.etfb.lk** වෙත පිවිසීමෙන් අයදුම්පත් බාගත හැක.

සෑම අයදුම්පතක් සමගින් ලියාපදිංචි ගාස්තුව වශයෙන් **රු.1000/- ක චෙක්පතක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය** නමින් අමුණා තිබිය යුතුය. (මෙම නීතිය රජයේ ආයතනයන්ට අදාළ නොවේ) ඊට අමතරව සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක්ද අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. තවද මිල ගණන් කැඳවීම විද්‍යුත් මාධ්‍ය හරහා සිදුකරන හෙයින් සෑම සැපයුම්කරුවෙකුට අදාළ විද්‍යුත් තැපෑල සැපයීම අනිවාර්ය වේ.

එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ලියාපදිංචි තැපෑල යටතේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. නැතහොත් කාර්යාල වේලාවන් තුළ එම ලිපිනයට භාරදිය හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ පුද්ගලිකව පැමිණ පහත සඳහන් ලිපිනයට භාරදිය හැකිය.

**කළමනාකරු (ප්‍රසම්පාදන),**
**ප්‍රසම්පාදන අංශය,**
**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය,**
**23 වන මහල, මෙහෙවර පියෙස,**
**නාරාහේන්පිට, කොළඹ 05.**

සැපයුම්කරුවන් ලියාපදිංචි සඳහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචිය 2026"** යනුවෙන් සටහන් කළ යුතුය.

දැන්වීමේ සඳහන් වන අයිතම ඕනෑම ප්‍රමාණයකට අයදුම් කිරීමට සැපයුම්කරුවන්ට හැකියාවක් පවතින අතර, එක් එක් අයිතම සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සාමාන්‍යයෙන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීම සිදුකරන අතර, අවස්ථානුකූලව වෙනත් පාර්ශවයන්ගෙන් මිල ගනන් කැඳවීමට අයිතිය මණ්ඩලය සතුවේ.

අයදුම්පත් භාර ගැනීම **2025 නොවැම්බර් මස 15** වන දිනෙන් අවසන් කෙරේ.

වැඩි විස්තර සඳහා කරුණාකර කළමනාකරු (ප්‍රසම්පාදන) දුරකථන අංක **011 7747236** හෝ **011 2806198** අමතන්න.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී**
**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**23 වන මහල, මෙහෙවර පියෙස,**
**නාරාහේන්පිට, කොළඹ 05.**

SELACINE MEDIA SOLUTIONS